**මහර ප්‍රාදේශීය සභාව - 2022**

**-------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 අහිතකර මතය**

මහර ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මාගේ වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2022 දෙසැම්බර් 31 දිනට මහර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 අහිතකර මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අහිතකර මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ අහිතකර මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව

විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ක්ෂය වටිනාකම රු.1,221,807 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | 2023 වර්ෂයේ අවසාන ගිණුමෙන් නිවැරදි කිරිමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | පුනරාවර්තන නොවන වියදම් සඳහා රජයෙන් කළ මාරු කිරීම් රු.853,255 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි | -එම- | -එම- |
| (ඇ) | බාහිර ආයතන 3 ක ඉදිකිරීම් සඳහා ලැබී තිබූ රු.2,416,434 ක් වූ ප්‍රාග්ධන ප්‍රදාන, ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමෙන් හා කෙරීගෙන යන වැඩ ගිණුමෙන් ඉවත්කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඈ) | කර්මාන්ත ණය හිමියෝ රු.18,700,715 ක් කපාහැරීමේදී කෙරීගෙන යන වැඩ ගිණුම බැර කළයුතු වුවත්, සමුච්චිත අරමුදල බැර කර තිබුණි. | -එම- | -එම- |
| (ඉ) | 2021 වර්ෂයේ පුස්තකාල පොත් ක්ෂය වටිනාකම රු.1,359,071 ක් ගිණුම්ගත නොකිරීමේ වරද නිවැරදි කිරීමේදී සමුච්චිත අරමුදල හර කරනු වෙනුවට ක්ෂය ගිණුම හර කර තිබුණි. | -එම- | -එම- |
| (ඊ) | 2022 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය අනුව ශුද්ධ වත්කම් වටිනාකම රු.118,952,135 ක් අඩුවෙන් දක්වා තිබුණි. | -එම- | -එම- |

| | | | |
|---|---|---|---|
| (උ) | විස්තීරණ ආදායම් ප්‍රකාශයේ වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ, වසර සඳහා අතිරික්තය/ඌනතාවයෙන් හඳුනා ගතයුතුව තිබූ ප්‍රාග්ධන වියදම් වටිනාකම අඩුකර දක්වා නොතිබීම හේතුවෙන් වසර සඳහා විස්තීරණ ආදායම රු.19,136,542 ක් වැඩියෙන් ගිණුම්ගතකර තිබුණි. | -එම- | -එම- |
| (ඌ) | ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනයේ පූර්ව කාලච්ඡේද වැරදි ගැලපීමට ජර්නල් සටහන් 7 ක වටිනාකම වන රු.38,441,384 ක් සමුච්චිත අතිරික්තයට බැර කළයුතු වුවත්, රු.39,147,467 ක් බැර කර තිබුණි. | -එම- | -එම- |

**1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 8 කට අදාලව 2022 දෙසැම්බර් 31 දිනට, මූල්‍ය ප්‍රකාශන අනුව එකතු වටිනාකම රු.259,608,046 ක් හා උපයෝගී ලේඛනවල එකතු වටිනාකම රු.176,686,926 ක් වූයෙන් රු.82,921,120 ක වෙනසක් විය. | 2023 වර්ෂයේ අවසාන ගිණුමෙන් නිවැරදි කිරිමට කටයුතු කරන බව. | වෙනස්කම් හඳුනාගෙන නිවැරදි කළ යුතුය. |

**1.7. අනුකූල නොවීම්**

**නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ

| | නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනත 24(1)ආ වගන්තිය | සභා බල ප්‍රදේශයට අයත් මාර්ග 3859 න් මාර්ග 3835 ක් ගැසට් කර නොතිබුණි. | මාර්ග මැනීමට විශාල මුදලක් වැය වන නිසා අයවැය ප්‍රතිපාදන මත මැනීම් සිදු කරන බව. | මාර්ග ගැසට් කරවා ගත යුතුය. |
| (ආ) | ප්‍රාදේශීය සභා මූල්‍ය පරිපාලනයට අදාල ගිණුම් කටයුතු පිළිබඳ රීති | | | |
| (i) | අංක 90 | මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම මත ගිණුම් තැබිය යුතු බව දක්වා ඇතත්, උසාවි දඩ හා මුද්දර ගාස්තු | මේ පිළිබඳ අවධානය යොමු කරන බව. | මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම මත ගිණුම් තැබිය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | මුදල් පදනම මත ගිණුම් තබා තිබුණි. | | |
| (ii) | අංක 300 | 2022 දෙසැම්බර් 31 දිනට රැස් නොකළ වෙළඳ බලපත්‍ර ගාස්තු රු.376,393 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් පිළිබඳ ඉදිරි ක්‍රියා මාර්ග ගන්නා බවද 2023 අවසන් ගිණුමෙන් නිවැරදි කිරීම් සිදු කරන බව. | රීති අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | වටිනාකම රු.1,612,771 ක්වූ වසර 2 ඉක්ම වූ තැන්පතු ශේෂ නියාදනය කර නොතිබුණි. | වසර දෙකක් ඉක්මවූ තැන්පතු වර්ග වලින් 2023 වර්ෂයේ යොමුකල ඉල්ලීම් ලිපි අනුව නැවත තැන්පතු ලබා දීම් සිදු කර ඇති අතර, ඒ අනුව වසර දෙකක් ඉක්ම වූ තැන්පතුවලින් රු.1,612,771 තව දුරටත් ඉතිරිව ඇති බව. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කලයුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1. මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්ම වූ ආදායම රු.77,588,762 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු. 85,829,929 ක් විය.

### 2.2. ආදායම් පරිපාලනය

#### 2.2.1. ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 77,562,990 | 84,062,374 | 76,825,240 | 101,137,252 | 77,388,000 | 80,893,754 | 17,714,748 | 60,881,768 |
| (ii) | කුලී | 4,666,074 | 4,266,074 | 4,099,420 | 166,654 | 4,841,900 | 4,201,808 | 2,726,507 | |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,120,000 | 1,120,000 | 743,607 | 376,393 | 1,120,000 | 1,120,000 | 647,200 | |
| (iv) | වෙනත් ආදායම් | 1,217,000 | - | 524,258 | - | 1,040,500 | - | 1,747,532 | - |
| | එකතුව | 83,566,064 | 89,448,448 | 82,192,525 | 101,680,299 | 84,390,400 | 86,215,562 | 22,835,987 | 60,881,768 |

### 2.2.2. ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **වරිපනම් හා බදු** | | |
| (i) | 2022 ජනවාරි 01 දිනට හිඟ වරිපනම් වටිනාකම රු.60,618,018 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසන් වනවිට රැස්කර නොගත් ආදායම රු.49,828,109 ක් වී තිබුණි. | මෙම හිඟ වරිපනම් මුදල අයකර ගැනීම සඳහා ජංගම සේවා පැවැත්වීම, ක්ෂේත්‍රයට ගොස් හිඟ බදු එකතු කිරීම, විධාන ලිපි යැවීම, ක්‍රියාත්මක කර ඇති බව. | පනතේ විධිවිධාන අනුව හිඟ වරිපනම් ආදායම අය කර ගනීමට කටයුතු කළ යුතුය. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ කර්මාන්ත බදු බිල්කල වටිනාකම රු.2,080,000 ක් වර්ෂය තුල රැස්නොකළ ආදායම රු.769,450 ක් විය. | අතපසු වීමකින් ඇස්තමේන්තු මුදල බිල් කර ඇත. කොවිඩ් වසංගතය හා ආර්ථික අර්බුදය නිසා ව්‍යාපාරික ස්ථාන වසා දමා තිබුණු බව. | සමීක්ෂණ සිදු කර නිවැරදිව කර්මාන්ත බදු බිල් කළ යුතුය. |
| (ආ) | **උසාවි දඩ හා මුද්දර ගාස්තු** | | |
| | 2020 වර්ෂයේ සිට මුද්දර ගාස්තු ආදායම් සහ උසාවි දඩ ආදායම් පිළිබඳ උපලේඛන ගෙන්වාගෙන ආදායම් ගිණුම්ගත කර නොතිබුණි. | 2020 වර්ෂය සඳහා උප ලේඛන සකස් කර ඇති බව. | උපලේඛන පිළියෙළ කර උසාවි දඩ හා මුද්දර ගාස්තු ගෙන්වා ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **ක්‍රියාකාරී සැලැස්ම** | | |
| | එක් එක් වැඩසටහන සඳහා වර්ෂයේ වෙන්වූ මුදල් ප්‍රමාණයන් දක්වමින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | 2023 වර්ෂය සඳහා සකස් කර ඇති බව. | නිවැරදි ලෙස ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කල යුතුය. |
| (ආ) | **ඝන අපද්‍රව්‍ය කළමනාකරණය** | | |
| | පුද්ගලික ආයතනයක්, සභාවේ වාහන 06 ක් සහ සේවකයන් 18 ක් ද යොදවා ගෙන කසළ බැහැර කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුල රු.36,453,827 ක් වැය කර තිබුණි. කොම්පෝස්ට් අංගනයක් ඉදිකිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියෙන් අක්කර 10 ක ඉඩමක් පවරාගැනීම සඳහා 2021 සැප්තැම්බර් 03 දින බස්නාහිර පළාත් පාලන කොමසාරිස් වෙත යොමුකර ඇතත්, 2023 මාර්තු 14 දින වන විටත් ඉඩම පවරාදී නොතිබුණි. | සභාවට රු.මි.70 ක ව්‍යාපෘතියක් මෙයට පෙර ලැබී මුදල් ප්‍රතිපාදන වෙන්කලද, රජයේ තක්සේරු මුදලට ඉඩමේ අයිතිකරුවන් අකමැති වූයෙන් ව්‍යාපෘතිය නතර වූ බව. | කොම්පෝස්ට් අංගනයක් ඉදිකර කසල කළමනාකරණය කල යුතුය. |

(ඇ) **පරිසර බලපත්‍ර**

| | | | |
|---|---|---|---|
| (i) | 2000 නොවැම්බර් මස 22 දිනැති අංක 1159/22 දරන අති විශේෂ ගැසට්පත්‍රය පරිදි පරිසර බලපත්‍රයක් කල් ඉකුත්වීමට මාස 03 කට පෙර බලපත්‍රය අළුත් කිරීමේ කටයුතු ආරම්භ කළයුතු වුවත් සභා බල ප්‍රදේශයේ 2021 ජනවාරි 21 දින සිට 2023 ජනවාරි 27 දක්වා කාලය තුල කල් ඉකුත්වී තිබූ නමුත් ව්‍යාපාරික කටයුතු කරගෙන යන ව්‍යාපාරික ස්ථාන 10 ක බලපත්‍ර අළුත්කිරීමේ කටයුතු ආරම්භකර නොතිබුණි. | ඉදිරියේදි මෙම කටයුතු නිසි පරිදි සිදු කිරීමට පියවර ගන්නා බව. | පරිසර බලපත්‍ර ලබානොගත් ආයතන පිලිබඳ පසු විපරම් කල යුතුය. |
| (ii) | පරිසර බලපත්‍ර ලබාගත යුතු ආයතන පිළිබඳව සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | ඉදිරියේදි සමීක්ෂණ කටයුතු සිදු කරන බව. | සමීක්ෂණය කල යුතුය. |

## 3.2. මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **ලැබියයුතු ශේෂ** | | |
| | මූල්‍ය ප්‍රකාශනය අනුව සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට කර්මාන්ත ණයගැති ශේෂය රු.8,231,524 ක් විය. | ඉදිරියේදී නිරවුල් කරන බව. | ලැබියයුතු ශේෂ නිරවුල් කරගත යුතුය. |
| (ආ) | **ගෙවියයුතු ශේෂ** | | |
| | (i) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට සැපයුම් ණය හිමි ශේෂය රු.57,702,714 ක් තුල ගෙවීම් හිගව පැවති කාලය වසර 1 ත් 3 ත් අතර රු.30,580,208 ක් විය. | -එම- | ගෙවිය යුතු ශේෂ නිරවුල් කළ යුතුය. |
| | (ii) මූල්‍ය ප්‍රකාශනය අනුව සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට කර්මාන්ත ණය හිමි ශේෂය රු.37,073,169 ක් විය. | -එම- | -එම- |

## 3.3. නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව සතු එකතුව රු.1,742,000 ක් වටිනා අත්ට්‍රැක්ටරයක් සහ ජල බවුසරයක් භාවිතා නොකර පැවතුණි. | මුදල් හා ප්‍රතිපත්ති කමිටු නිර්දේශය පරිදි ගලි බවුසරයක් ලෙස නවීකරණය කරන බව. | නවීකරණය කර භාවිතයට ගත යුතුය. |

## 3.4. වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව යටතේ ක්‍රියාත්මක වන පුස්තකාල 8 ක රැගෙන ගොස් ආපසු භාර නොදුන් වටිනාකම රු.476,079 ක් වූ පොත් 1350 ක් සහ සමීක්ෂණයට ඉදිරිපත් නොවූ වටිනාකම රු.424,746 පොත් 1460 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | අදාල පුස්තකාල වෙත දන්වා තොරතුරු ලැබෙමින් පවතින අතර, නිවැරදි කිරීමට කටයුතු කරන බව. | අලාභය අයකර ගත යුතුය. |
| (ආ) | වටිනාකම රු.3,500,000 ක් වූ පැලියගොඩ නගර සභාවෙන් ලැබී තිබූ බැකෝ යන්ත්‍රයෙහි අයිතිය පවරාගැනීමට කටයුතුකර නොතිබුණි. | පවරාගැනීමට කටයුතු කරන ලද බව. | අයිතිය පවරා ගත යුතුය. |

## 3.5. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **සේවක ණය** | | |
| ස්ථාන මාරුවී ගිය, විශ්‍රාම ගිය සහ මිය ගිය නිලධාරීන් හත් දෙනෙකුගෙන් ණය හා අත්තිකාරම් ශේෂය රු.1,158,543 ක් අයවීමට පැවතුණි. | ඇපකරු විශ්‍රාම ගොස් තිබීම, එතෙර ගොස් තිබීම, මරණ පාරිතෝෂිතය ලැබී නොතිබීම, විශ්‍රාම පාරිතෝෂිතය ලැබී නොතිබීම වැනි හේතු නිසා අය කර ගැනීමට නොහැකි වූ බව. | සේවක ණය අයකර ගත යුතුය. |